# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2274/41 - 2022 අප්‍රේල් මස 09 වැනි සෙනසුරාදා - 2022.04.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

**7 වැනි වගන්තිය යටතේ දැන්වීම**

*යොමු අංකය :* ත්‍රිපාලේ/ඉ7/ඉඅත්/12.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :* 4-3/9/2013/IR/353.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් අත්කර ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිස්සපුර අංක 28 ග්‍රාම නිලධාරි වසමේ, අඳල්ල (කොටසක්) ගමේ, අ. ග. පි. 620 දරන පිඹුරේ, අතිරේක අංක 3හි, අංක 3 දරන පත්‍රයේ පිහිටි පහත විස්තරකර ඇති ඉඩම :

01. **කැබලි අංකය 31**
ඉඩමේ නම: අඳල්ලවෙල; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: නැසීගිය කේ. ජී. ඒ. ගුණදාස; ප්‍රමාණය: හෙක්. 0.1073

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 ජූලි 04 වැනි දින පෙ. ව. 10.00 ට තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2022 ජූනි 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 2 ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

වන්දිමා මනම්පේරි,
ප්‍රාදේශීය ලේකම්,
තිස්සමහාරාම.

2022.04.04 වැනි දින,
තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 04 - 0061


1A - G 36573 – 22 (2022/04)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*